# රන් බිජු සොයා
# මිනි පුර දිය දහරාවන් වැනසීම

**සජීව චාමිකර**

**ශ්‍රී ලංකා සොබා සංසදය**

රත්නදීපය ලෙස අප රට හැඳින්වූයේ මිණිපුර හෙවත් රත්නපුරයේ මැණික් නිසාය. ඉතා දුර්ලභ පාෂාණීභූත ඛනිජයක් ලෙස පවතින මැණික් වලට ඉතා ඉහළ ඉල්ලුමක් පවතී. විපරීත පාෂාණ ගණයට අයත් ඛනිජයක් වන මෙය වසර දස ලක්ෂ හාරසියයකට පමණ පෙර කේම්බ්‍රිය යුගයේ දී නිධිගත වන්නට ඇතැයි සැලකේ.

රත්නපුර දිස්ත්‍රික්කයේ හා ඒ ආසන්න ප්‍රදේශ පුරා ව්‍යාප්තව ඇති මැණික් නිධි අප සතු අමිල වූ සම්පතකි. මෙම සම්පත මතු කර ගැනීම ඉතා වෙහෙසකර හා දුෂ්කර කාර්යයකි. අතීතයේ සිට මේ දක්වා කාලය තුළ දී රුපියල් ට්‍රිලියන ගණනක් වටිනා මැණික් මේ පොළෝ තලයෙන් මතු කර ගන්නට ඇත. ශිල්පීය කැණීම් ක්‍රම භාවිතයෙන් එනම් මිනිස් ශ්‍රමය යොදා ගැනීමෙන් සිදු කරන ක්‍රම ආධාරයෙන් මෙතෙක් කලක් පොළවේ සැඟවී තිබූ මැණික් මිනිසාගේ අතට පත් කර ගත්හ. මේ සඳහා ගඟ ඇදීම, ගඟ ගැරීම, රිටි අඩිය ඇදීම (පැලීම), ගොඩ ගැරීම වැනි ශිල්පීය ක්‍රම භාවිතා කළහ. ගොඩ පතල් කැණීමෙන් හෝ ගං පතුල් කැණීම මගින් ලබා ගන්නා ඉල්ලම්, කූඩ ගැරීම මගින් හෝ සැල්ලඩ ගැරීම මගින් මැණික් මතු කර ගත්හ.

මිනිසාගේ දියුණුවත්, මුදල් සෙවීම සඳහා ඉක්මන් ක්‍රම සෙවීමේ උත්සාහයේ ප්‍රතිඵලත් හේතුවෙන් අද වන විට යාන්ත්‍රික ක්‍රම මගින් මැණික් කැණීමේ තත්ත්වයට මිනිසා පරිණාමය වී ඇත. ඊට සමාන්තරව මිනිස් ශ්‍රමය යොදවා සිදු කරන පතල් කැණීමේ දී මෙන් සිය දහස් ගුණයක පරිසර හානියක් හා භූමිය අස්ථාවර වීමක් යාන්ත්‍රික පතල් කැණීම නිසා සිදු වේ. මේ තත්ත්වය පළමුව අත් දකින්නට ලැබුණේ දැනට වසර කිහිපයකට පෙර බගවන්තලාව ප්‍රදේශයේ දී ය. කෙසෙල්ගමුව ඔයේ වම් ඉවුරේ පිහිටි වැපල්ටන් වතු සමාගමට අයත් ඉඩම් වල මැණික් පතල් කැණීම හේතුවෙන් එම ප්‍රදේශයේ භූමිය, කාසල්රී ජලාශය හා කෙසෙල්ගමුව ඔය දැඩි බලපෑමකට ලක් විය. එම තත්ත්වය ඇති වීමට ප්‍රධාන හේතුව වූයේ බැකෝ යන්ත්‍ර යොදා ගෙන කැණීම් කර මහා පරිමාණයෙන් මැණික් ගැරීමයි. මෙය ''රන් බිජු දමන තාරාවාගේ බඩ පලා රන් බිජු ලබා ගැනීමට තැත් කිරීමට'' දෙවෙනි නොවේ.

යාන්ත්‍රික පතල් කැණීම් මෙම තත්ත්වයට පමණක් සීමා වී නොමැත. රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි බොහෝ ජල මාර්ග අද වන විට යාන්ත්‍රික පතල් කැණීමේ ග්‍රහනයට දැඩි සේ ගොදුරු වී ඇත.

මෙහි දී සිදු වන්නේ අධි බලැති එන්ජිම් ආධාරයෙන් ජලයෙන් වැසී පවතින ගංගා, ඇළ, දොළ පතුලේ ඇති මැණික් ඉල්ලම් නල මාර්ගයෙන් මතු පිටට ඇද ගැනීමයි. මෙය එම ප්‍රදේශයේ හඳුන්වන්නේ ''පොම්ප ගැසීම'' ලෙසය. මේ සඳහා භාවිතා කරන්නේ ලොරි රථ වල එන්ජිම් ආධාරයෙන් සකසා ගත් යන්ත්‍රයකි. මෙම එන්ජිම ''උකහා ගැනීමේ'' (Sucker) යන්ත්‍රයකට සම්බන්ධ කරනු ලැබේ. ඊට අඟල් 6 - 7 පමණ විෂ්කම්භයකින් යුතු ශක්තිමත් නල සම්බන්ධ කර අධි බලැති යන්ත්‍ර සකස් කර ගැනීම සිදු කරති. යන්ත්‍රය හා සම්බන්ධ නල වල නිදහස් කෙළවරට ලෝහමය, අඩියක්

පමණ දිග දැඩි ශක්තිමත් නලයක් සම්බන්ධ කර ඇත. මෙම එක් යන්ත්‍රයක් සකස් කර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 7 - 8 ක් පමණ මුදලක් වැය කිරීමට සිදු වේ.

ජල මාර්ගයක විශාල වලවල් හාරා ඉල්ලම මතු කර ගෙන වතුර පිරී ඇති වල වල් තුළ කිමිදුම්කරුවන් භාවිතා කර ගෙන අධි බලැති යන්ත්‍රය හා සම්බන්ධ නල මාර්ගයෙන් මතු පිටට ඉල්ලම් පස් ඇද ගනී. මෙම ඉල්ලම් සේදීමෙන් මැණික් මතු කර ගනිති. ඉල්ලම් සේදීම සඳහා කුඩ ගැරීම මෙන්ම සැල්ලඩ ගැරීමේ ක්‍රමය ද භාවිතා කරනු ලැබේ. සැල්ලඩ ගැරීමේ දී ඉල්ලම් පස් ගොඩ ගසා ඒවාට වතුර පොම්ප කර පස් සේදීයාමට සලස්වා මැණික් මතු කර ගනිති.

මෙම යන්ත්‍ර ආධාරයෙන් ජල මූලාශ්‍ර වල පතුල මීටර 25 - 30 ක් පමණ ගැඹුරට කැණීම සිදු කරති. මෙම යන්ත්‍ර භාවිතා කිරීමේ දී ගඟ පතුලේ පිහිටි මැණික් ඉල්ලම් වල විශාල ප්‍රදේශ කැඩී නල තුළින් මතු පිටට ලබා ගනී. මෙම ක්‍රමයෙන් මැණික් පතල් කැණීම වියළි සෘතුවේ දී බහුලව සිදු කරයි. වැසි කාල වල දී ජල මාර්ග වල වතුර මට්ටම ඉහළ ගිය පසුව හා වර්ෂා කාලයේ දී ගසාගෙන එන රොන් මඩ ඇතුළු ද්‍රව්‍ය වරින් වර ගංගා පතුලේ තැම්පත් වීම නිසා මෙම ක්‍රමය භාවිතයෙන් පතල් කැණීම තරමක් අපහසුවේ. නමුත් දැනට මෙම ක්‍රමය වැසි කාල වල දී ද යොදා ගනු ලබනු නිරීක්ෂණය කළ හැකි වී ඇත.

රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල, රත්නපුර, කිරිඇල්ල, අයගම හා පැල්මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට අයත් ප්‍රදේශ වල ඉතා දරුණු ලෙස යාන්ත්‍රික පතල් කැණීම සිදුවේ. මෙය ප්‍රධාන වශයෙන්ම සිදු වන්නේ කළු ගඟේ සහ කළු ගඟ හා සම්බන්ධ අතු ගංගාවන් වන වේ ගඟ, කරවිට ගඟ, ගල්තුර ගඟ, හංගමු ගඟ හා දෙනවක් ගඟ යන ජල මාර්ග වලය. මීට අමතරව කළු ගඟේ ගිලීමලේ මල්වල ප්‍රදේශයේ, කිරිඇල්ල ප්‍රදේශයේ හා දුම්බර ප්‍රදේශයේ මෙය බහුලව සිදු කෙරේ.

වේ ගඟ යාන්ත්‍රික පතල් කැණීමට ඉතා දරුණු ලෙස ගොදුරු වී ඇති ජල මාර්ගයකි. මෙම ගඟේ වටාපත ප්‍රදේශයේ පිහිටි බැංකු වල හා බණමඩු වල කොටසේ හා මීරියන් දොළ වේ ගඟ හා සම්බන්ධ වන ස්ථානයේ මහා පරිමාණයෙන් යාන්ත්‍රික පතල් කැණීම සිදු වේ. සංවිධානාත්මකව සිදු වන මෙම පතල් කැණීම නිසා ජල මාර්ග සියල්ලම විකෘති තත්ත්වයට පත් ව තිබේ. රත්නපුර දිස්ත්‍රික්කය තුළ පතල් කැණීමේ යන්ත්‍ර 45 ක් පමණ යොදා ගන්නා බවට සංගණනයන් ගෙන් තහවුරු වී තිබේ.

මේ ආකාරයට පතල් කැණීම් වල දී ජලයට එක් වන රොන් මඩ ප්‍රමාණය ඉතා අධිකය. පතල් කැණීම සඳහා ඇල මාර්ග දිගේ තැනින් තැන විශාල වල වල් සකස් කිරීම හා ජල මාර්ග අවහිර කර මින් මැණික් ඉල්ලම් සේදීම සඳහා ජලය ලබා ගැනීම ආදී සියලු ක්‍රියා වල ප්‍රතිඵලයක් ලෙස ජල මාර්ග සම්පූර්ණයෙන්ම වෙනස්කම් වලට භාජනය වීම හා ජෛව ප්‍රජාව සහමුලින්ම විනාශයට පත් වීම සිදු ව ඇත.

වියළි කාල වල දී මෙම යාන්ත්‍රික පතල් කැණීම බහුලව සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඒ අවට ජීවත් වන ප්‍රදේශවාසීන් විවිධාකාර පීඩාකාරී තත්ත්වයන්ට ගොදුරු ව සිටී. පතල් කැණීම නිසා ගංගා පතුල අධික ලෙස ගැඹුරු වීමෙන් අවට භූගත ජල මට්ටම ඉතා දරුණු ලෙස පහළ බැස ඇත. මේ නිසා අවට ප්‍රදේශවාසීන් පානීය ජල අර්බුදයකට මුහුණ පා සිටිති. නමුත් ඔවුන් මේ පිළිබඳව හඬක් නැගීමට හෝ ඒ පිළිබඳව ප්‍රකාශ කිරීමට පවා බිය වී සිටින්නේ නීති විරෝධී මැණික් පතල් සඳහා දේශපාලන බලය මෙන්ම මැර බලය ද යොදා ගැනීම නිසාය.

රත්නපුර ආශ්‍රිත පානීය ජල අර්බුදයන්ට මුහුණ පා සිටින ප්‍රදේශවාසීන්ට ජලය ලබා ගැනීමට ඇති එකම ජල මූලාශ්‍රය එම ප්‍රදේශ වල පිහිටි ජල මාර්ගයන්ය. නමුත් මෙම ජල මාර්ග වල ජලය පානයට තබා සේදුම් කටයුතු වලටවත් භාවිතා කළ නොහැකිය. ඊට හේතුව අධික රොන් මඩ ප්‍රමාණයක් ඝුඹුරු පැහැයෙන් ඉල්ලම් සේදීම නිසා නිරන්තරයෙන් ගලා යාමයි. ඒ හේතුවෙන් මෙම ප්‍රදේශ වල ජනතාව කර කියා ගත හැකි කිසිදු දෙයක් නොමැතිව දේශපාලන බලය හා මැර බලය ඉදිරියේ තම මූලික අයිතිවාසිකම් පවා අහිමි ව නිහඬව බලා සිටිති.

යාන්ත්‍රික පතල් කැණීම් ප්‍රදේශ ආසන්නයේ ජීවත් වන ජනතාව ජල අර්බුදයෙන් බැට කද්දී ඔවුන්ට තවත් ප්‍රධාන තර්ජනයකට මුහුණ දීමට සිදු ව තිබේ. එනම් ශබ්ද දූෂණයටය. අධික ශබ්දයකින් ක්‍රියාකරන පතල් කැණීමේ යන්ත්‍ර වල නිරන්තර ශබ්දයට ගොදුරු වෙමින් තම නිදහස් ජීවන පැවැත්ම ද අහිමි කර ගෙන ඔවුහු දිවි ගෙවති. නිල බලය, දේශපාලන බලය හිමි මුදලාලිලා තම බිමේ සාරය උරා ගනිද්දී මේ මිනිසුන් අසරණව බලා සිටින්නේ තමන්ට කර කියා ගත හැකි දෙයක් නොමැති කමිනි.

මෙවන් හිරිහැර විද දරා ගෙන සිටීමට නොහැකි අවස්ථාවක දී සමහරුන් පොලිසියට ගොස් මෙම තත්ත්වයන් පිළිබඳව පැමිණිලි කරති. එය ''හොරාගේ අම්මාගෙන් පේන ඇහීමට'' දෙවැනි නැත. සමහර ස්ථාන වල යාන්ත්‍රික පතල් කැණීම මෙහෙය වන්නේ පොලිසියේ ඉහළ නිල දරණ පුද්ගලයින් ය.

මැණික් පතල් කැණීම් ක්‍රමානුකූලව සිදු කිරීමෙන් පරිසරයට සිදුවන හානි අවම කිරීම සඳහා නීති රීති බොහොමයක් අණ පනත් වලට ඇතුළත් කර ඇත. ඒ අතුරින් ප්‍රධාන තැනක් ගන්නේ 1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනතයි. මෙම පනතින් ස්ථාපිත මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් අවසර ලබා ගැනීමකින් තොරව මැණික් පතල් කැණීම් සිදු කළ නොහැකිය.

නමුත් එකම යාන්ත්‍රික පතල් කැණීමක් සඳහාවත් මෙම අධිකාරිය මගින් බලපත්‍ර නිකුත් කර නොමැත. එබැවින් මෙම ප්‍රදේශ වල සිදු වන සියලුම යාන්ත්‍රික පතල් කැණීම් නීති විරෝධී ඒවාය. මේවා මැඩ පැවැත්වීමේ හැකියාව පොලිසියට මෙන්ම අදාළ අධිකාරියට ද ඇත. නමුත් දේශපාලන බලය, නිල බලය හා ධන බලය ඉදිරියේ නිලධාරීන් මුණිවත රකිති.

එමෙන්ම නිලධාරීන්ට මෙය මුදල් උපයන මාර්ගයක් බවට පත්ව තිබේ. එහෙයින් ඔවුන් මෙම නීති වරෝධී ක්‍රියා නතර කිරීමට උත්සාහ නොගනිති. සමහර නිලධාරීන් පවසන්නේ පොළවේ සැගවී ඇති මෙම වස්තුව මතු පිටට ගෙන මුදල් බවට පත් කර ගත යුතු බවයි. එසේ සිතන ඔවුන් තමන්ට ලැබෙන ලක්ෂ ගණනක් වන සන්තෝෂම් මුදල් තම ගිණුමේ තැම්පත් කර ගෙන පරිසරය වනසන ජාවාරම්කරුවන්ට රිසි සේ ක්‍රියා කිරීමට ඉඩ දී බලා සිටිති.

මහජන විරෝධය මත වැටලීම් සිදු කර නීති විරෝධී කැණීම් උපකරණ හා පුද්ගලයින් අත්අඩංගුවට ගත්ත ද දේශපාලන බලපෑම් මත ඒවා සියල්ලම නිදහස් කිරීමට සිදු වේ. මේ නිසා නිලධාරීන් ද ඊට ඇඟිලි නොගසා ජාවාරම්කරුවන්ට රිසි සේ ක්‍රියාකිරීමට ඉඩ දී බලා සිටිති. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මැණික් පතල් බදු දීමට ප්‍රථම මැණික් නිධිගත වී ඇති ස්ථාන හඳුනාගෙන එම ස්ථාන පිළිබඳව වාර්තාවක් සකස් කර පාරිසරික අනුමැතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලබයි. එවිට කොන්දේසි සහිත අනුමැතියක් ලැබුණු පසුව අදාළ භූමියේ පිහිටීම මත හා ඉඩම් වල අයිතිය මත අනෙක් අදාළ අංශ වල අවසර ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රසිද්ධ වෙන්දේසියේ බදු දෙනු ලැබේ. ඉන් පසු අදාළ පුද්ගලයින්ට කොන්දේසි මත පතල් කැණීම සඳහා අවසර ලැබේ.

1988 අංක 56 හා 2000 අංක 53 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතට අනුව ප්‍රකාශිත 2006 ජූලි 17 දින අංක 1454/14 දරණ ගැසට් නිවේදනයට අනුව තහනම් උපකරණ වන උකහාගැනීමේ යන්ත්‍ර භාවිතා කර ගංගාවක මැණික් කැණීම් තහනම් වේ. මෙවන් නීති රීති පැවතිය ද රත්නපුර දිස්ත්‍රික්කය තුළ දිය දහරාවන් වනසමින් සිදු කරන නීති විරෝධී යාන්ත්‍රික පතල් කැණීම් වැළැක්වීමට පියවර ගැනීමේ අධිකාරී බලය හිමි මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය හා පොලීසිය නිහඬව සිටින්නේ කුමක් නිසා දැයි අපට විශාල ප්‍රශ්නයක් මතුව තිබේ.

මේ පිළිබඳව අවබෝධ කරගත් පුද්ගලයින් විසින් පරිසර හානිකර හා විනාශකාරී අන්දමින් සිදුවන යාන්ත්‍රික පතල් කැණීම් නතර කිරීමට වහාම පියවර ගන්නා ලෙස අදාළ රාජ්‍ය ආයතන දැනුවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පොලීසිය මගින් වේ ගඟේ, වටාපත ප්‍රදේශයේ බැංකු වල ලෙස හඳුන්වන ස්ථානයේ මහා පරිමාණ යාන්ත්‍රික මැණික් කැණීම් නතර කිරීමට පියවර ගෙන ඇති අතර එම ස්ථානයේ 2007 වසරේ දී පොලිස් මුර පොලක් ද පිහිටුවන ලදී. ඊට අමතරව මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් බඹරබොටුව ගඟේ හා දෙනවක් ගඟේ ස්ථාන කිහිපයක යාන්ත්‍රික මැණික් කැණීම් නතර කිරීමට පියවර ගෙන තිබේ.

නමුත් අද වන විට තවත් බොහෝ ප්‍රදේශ වල යාන්ත්‍රික මැණික් කැණීම් එලෙසම සිදු වේ. විශේෂයෙන් බණමඩු වල, දැල පාලම අසල හා දුම්මලවත්ත ප්‍රදේශයේය. මේ තත්ත්වයන් නතර කිරීමට අදාළ රාජ්‍ය ආයතන වලට නොහැකි වී ඇත්තේ මන් ද යන්න ගැටළුවකි.

මෙවන් නීති විරෝධී ක්‍රියා සිදුවෙද් දී 2009 මැයි 28 වන දින ලැබුණු කැබිනට් අනුමැතියකට අනුව රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කහන්ගම ප්‍රදේශයේ කළු ගඟේ මැණික් කැණීම් සඳහා 2009 ජූලි 2 වනදා ගඟ වෙන්දේසි කරන ලදී. මෙම වෙන්දේසියේ දී කළු ගඟේ මීටර් 50 ක දිගින් යුත් කොටස් 4 ක් මැණික් කැණීම සඳහා වෙන්දේසි විය. එම කොටස් 4 ම ලබා ගෙන ඇත්තේ ආණ්ඩුකාර ඩික්සන් දැල බණ්ඩාර මහතා විසිනි. ඔහුගේ නමින් කැණීම් භූමිය වෙන්දේසියෙන් මිල දී ගෙන නොතිබුණ ද මෙම ස්ථානයේ කැනීම් කටයුතු මෙහෙය වීම හා මුදල් යෙද වීම යන සියල්ලම සිදු කරන්නේ ඔහු විසිනි. මේ සඳහා කැබිනට් අනුමැතිය ලබා දීම හා වෙන්දේසිය පැවැත් වීම යන සියල්ල සිදු කෙරුනේ ද ඔහුගේ පෙළඹ වීම මතය. සුළු මැණික් ව්‍යාපාරිකයින් වල පල්ලට යවමින් සිදු වන මෙම මහා පරිමාණ මැණික් කැණීම හේතුවෙන් සිදු වන හානිය සුළු පටු නොවේ. ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අදූරදර්ශී නිලධාරීන්ගේ අනුමැතිය ද ලැබී තිබේ.

ගඟ ඇදීමේ ශිල්පීය ක්‍රමය යටතේ වෙන්දේසියෙන් අවසර ලබාගෙන අද වන විට උකහාගැනීමේ අධිබලැති යන්ත්‍ර 8 ක් භාවිතයෙන් දිවා රාත්‍රි දෙකෙහිම මෙම ස්ථානයේ මහා පරිමාණයෙන් කැණීම් කටයුතු සිදු වේ. ඉන් සිදු වන හානිය ශිල්පීය ක්‍රමයෙන් සිදු වන හානිය මෙන් සිය දහස් ගුණයකි.

මධ්‍යම පරිසර අධිකාරිය, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සහ පොලීසිය වැනි මහජන මුදලින් නඩත්තු කරන ආයතන බිහි කර ඇත්තේ වර්තමාන හා අනාගත පරපුරට යෝග්‍ය පරිසරයක් ඇති කිරීමේ අරමුණ ඇතිවය. එවන් ආයතන ද දේශපාලන බලපෑම් ඉදිරියේ අකර්මන්‍යව සිටී නම් මෙවන් ආයතන පිහිටු වීමේ අරමුණ කිමෙක් ද. අද වන විට මෙම ප්‍රශ්නය සම්පූර්ණ රත්නපුර දිස්ත්‍රික්කය වසා ගෙන පවතී. මෙම ප්‍රශ්නයේ මූලික අදියරේ දී මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය නිසි පියවර ගත්තා නම් මෙවන් දරුණු තත්ත්වයක් ඇති වීමට ඉඩකඩ නොතිබෙන්නට තිබුණි. තම වගකීම් නිසි ලෙස ඉටු නොකර ප්‍රශ්නය දුර දිග ගිය පසුව එය පාලනය කිරීමට යාම අපහසු ක්‍රියාවකි. අදවන විට

රත්නපුර ප්‍රදේශයේ යාන්ත්‍රික මැණික් පතල් කැණීමේ සංස්කෘතියක් බිහි වී ඇත. කිම්දුම්කරුවන්, කම්කරුවන්, යන්ත්‍ර සකස් කරන්නන්, යන්ත්‍ර අළුත් වැඩියා කරන්නන් යන බහුතර පිරිසකි බිහි වී ඇත. එක් එක් වෘත්තීය නිපුණතාව ඇති පුද්ගලයින්ගෙන් යැපෙන විශාල පිරිසක් ද සිටී. මීට අමතරව ඔත්තු බලන්නන් පිරිසක් ද බිහි වී ඇත. ඔවුන්ගේ රාජකාරිය නාඳුනන පුද්ගලයන් හෝ වාහන යාන්ත්‍රික පතල් කැණීම් ප්‍රදේශ ආසන්නයට පැමිණෙන විට ඒ බව අදාළ පුද්ගලයන්ට වහාම දැනුම් දීමයි. මේ ආකාරයට සංවිධානාත්මකව නීති විරෝධී යාන්ත්‍රික පතල් කැණීම් රත්නපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වේ.

මේ තත්ත්වයට පත් වන තුරු නැතහොත් ප්‍රශ්නය උඩු දුවන තුරු මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නිලධාරීන් නිදා සිටියේ දැයි ප්‍රශ්නයකි. අප විසින් අවධාරණය කරන්නේ මෙම තත්ත්වය තව තවත් වර්ධනය වීමට ප්‍රථම හැකි ඉක්මනින් ක්‍රියාත්මක වී යාන්ත්‍රික මැණික් කැණීම් නතර කිරීමට පියවර ගන්නා ලෙසය. වර්තමානයේ දී මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ජාතික ව්‍යවසාය හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වේ. අදාළ විෂයභාර අනුර ප්‍රියදර්ශන යාපා සහ මනෝ විජේරත්න (කැබිනට් නොවන අමාත්‍ය) යන අමාත්‍යවරුන්ගේ යුතුකම හා වගකීම වන්නේ අදාළ අධිකාරියේ වැඩ කටයුතු පිළිබඳ සොයා බලා නිලධාරීන් තමන්ගේ වගකීම් ඉටු නොකිරීමට හා අල්ලස් ලබා ගෙන නීති විරෝධී යාන්ත්‍රික මැණික් කැණීම් සඳහා ඉඩ කඩ ලබා දීමට එරෙහිව නිසි පියවර ගැනීම මෙන්ම දැනට උද්ගත වී ඇති පාරිසරික හානිකර යාන්ත්‍රික පතල් කැණීම් වහාම නතර කිරීමට පියවර ගැනීමයි.

ඉන් පසුව අදාළ පනතේ දැක්වෙන ලෙසට අධිකාරිය සතු බලතල යටතේ මධ්‍යම පරිසර අධිකාරියේ ද අනුමැතිය මත මැණික් ලබා ගැනීමට යෝග්‍ය ස්ථාන හඳුනාගෙන ක්‍රමානුකූලව මෙම සම්පත මතු කර ගැනීමෙන් රටට විදේශ විනිමය උපයා ගැනීමට වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ හැකිය. එවිට පරිසරයත් මිනිසාගේ පැවැත්මත් යහපත් වනු ඇත.



**කළු ගඟේ නීති විරෝධී යාන්ත්‍රික මැණික් කැණීම් සිදු කරන ස්ථාන**

ශ්‍රී ලංකා සොබා සංසදය

අංක - 546/3,

වට මාවත,

ගංගොඩවිල,

නුගේගොඩ,

දුරකතනය - 011 2803139

ඊ මේල් - slnf@sltnet.lk

වෙබ් අඩවිය - www.slnf.net